# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2075/50 - 2018 ජුනි මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2018.06.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

(262 වැනි අධිකාරය)

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ (1) (අ) වන වගන්තිය යටතේ**
**බලංගොඩ නගර සභාවේ**
**සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතු කොට ගෙන බලංගොඩ නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66අ (1) (අ) වන වගන්තිය යටතේ බලංගොඩ නගර සභාවේ අංක 10 ඇල්ලෙපොල කොට්ඨාසයට තේරී පත්වූ සුගත් ඉන්ද්‍රජිත් වඩුදුරගේ අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම බලංගොඩ නගර සභාවේ අංක 10 ඇල්ලෙපොල කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඒකනායක රාජපක්ෂ බස්නායක මුදියන්සේලාගේ අකිල සාලිය එල්ලාවල නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

බලංගොඩ නගර සභාවේ තේරීම් භාර නිලධාරී රවීන්ද්‍ර සුභාෂණ වෙදගේ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 66අ (1) (අ) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ඒකනායක රාජපක්ෂ බස්නායක මුදියන්සේලාගේ අකිල සාලිය එල්ලාවල, බලංගොඩ නගර සභාවේ අංක 10 ඇල්ලෙපොල කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

රවීන්ද්‍ර සුභාෂණ වෙදගේ,
තේරීම් භාර නිලධාරී,
බලංගොඩ නගර සභාව.

2018 ජුනි මස 13 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
රත්නපුර.

06 - 1087


1A - G 27874 — 17 (2018/06)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*